**ශීර්ෂය 153 ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේවූ දෙපාර්තමේන්තු පිළිබඳ විගණකාධිපති වාර්තාව - 2013 වර්ෂය**

---

**මෙම වාර්තාව කොටස් දෙකකින් සමන්විත වේ.**

**1 කොටස - අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

**2 කොටස - එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

**1 කොටස**

**ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තුවල ගිණුම් පිළිබඳ සම්පිණ්ඩන වාර්තාව**

---

**1 අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු**

| ශීර්ෂය | දෙපාර්තමේන්තුව |
|---|---|
| 286 | ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව |
| 287 | ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව |
| 288 | මිනින්දෝරු දෙපාර්තමේන්තුව |
| 327 | ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව |

**2. ගිණුම්**

**2.1 විසර්ජන ගිණුම්**

**මුළු ප්‍රතිපාදනය හා වියදම**

අමාත්‍යාංශය හා එම අමාත්‍යාංශය යටතේ වූ දෙපාර්තමේන්තු 04 ක් සඳහා සළසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු. 5,455,285,640 ක්වූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට ඉන් රු. 4,807,663,431 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව අමාත්‍යාංශයේ හා එක් එක් දෙපාර්තමේන්තුවේ ශුද්ධ ප්‍රතිපාදනයන්ගෙන් ඉතිරිවීම් රු. 1,793,803 ත් රු. 541,595,589 ත් අතර පරාසයක ප්‍රමාණයකින් හෙවත් ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 1 ත් සියයට 20 ත් අතර පරාසයක පැවැතුණි. විස්තර පහත දැක්වේ.

| ශීර්ෂය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ශුද්ධ ප්‍රතිපාදනය | උපයෝජනය | ඉතිරිය | |
| | රු. | රු. | රු. | |
| 153 | 2,670,181,540 | 2,128,585,951 | 541,595,589 | 20 |
| 286 | 257,730,000 | 253,052,625 | 4,677,375 | 2 |
| 287 | 206,294,100 | 204,500,297 | 1,793,803 | 1 |
| 288 | 2,083,110,000 | 1,991,473,388 | 91,636,612 | 4 |
| 327 | 237,970,000 | 230,051,170 | 7,918,830 | 3 |
| **එකතුව** | **5,455,285,640** | **4,807,663,431** | **647,622,209** | |

## 2.2 ආදායම් ගිණුම්

### ඇස්තමේන්තුගත හා තථ්‍ය ආදායම

අමාත්‍යාංශය හා අමාත්‍යාංශය යටතේ ඇති දෙපාර්තමේන්තු 02 ක් විසින් 2013 වර්ෂය සඳහා ආදායම් සංකේත 02 ක් සඳහා එකතුව රු.මිලියන 157ක ආදායම් ඇස්තමේන්තු කර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 182 ක ආදායමක් රැස්කර තිබුණි. ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 9 ත් සියයට 41 අතර පරාසයක ප්‍රතිශතයන්ගෙන් ආදායම් රැස්කර තිබුණි. විස්තර පහත දැක්වේ.

| ආදායම් සංකේතය | 2013 දෙසැම්බර් 31 දිනට | | | ඉක්මවීම/ (ඌනතාවය) ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | ඉක්මවීම/ (ඌනතාවය) | |
| | රු. | රු. | රු. | |
| 20.02.01.03 | 35,000,000 | 49,503,519 | 14,503,519 | 41 |
| 20.03.02.04 | 122,000,000 | 132,827,068 | 10,827,068 | 9 |
| | 157,000,000 | 182,330,587 | 25,330,587 | |

## 2.3 අත්තිකාරම් ගිණුම්

**2.3.1 රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**---------------------------------------**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

**---------------------------------------------**

අමාත්‍යාංශය හා ඒ යටතේ වන දෙපාර්තමේන්තු 04 කට අදාල රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් වෙනුවෙන් පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| විෂය අංකය | වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|---|
| | උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 15301 | 13,000,000 | 8,642,601 | 4,500,000 | 9,426,432 | 50,000,000 | 24,156,453 |
| 28601 | 19,000,000 | 13,657,950 | 11,000,000 | 14,586,514 | 85,000,000 | 50,441,975 |
| 28701 | 18,000,000 | 9,443,070 | 6,500,000 | 8,168,760 | 48,000,000 | 34,719,528 |
| 28801 | 155,000,000 | 96,603,627 | 100,000,000 | 109,124,602 | 492,000,000 | 293,076,656 |
| 32701 | 18,000,000 | 17,534,785 | 6,500,000 | 7,764,354 | 60,000,000 | 43,842,658 |

**2.4 පොදු තැන්පත් ගිණුම්**

**----------------------**

අමාත්‍යාංශය හා අමාත්‍යාංශංශය යටතේ වන දෙපාර්තමේන්තු03 ක 2013 දෙසැම්බර් 31 දිනට තැන්පත් ගිණුම්වල ශේෂ එකතුව රු. 186,293,178 ක් විය. විස්තර පහත දැක්වේ.

| අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව | තැන්පත් ගිණුම් අංකය | 2013 දෙසැම්බර් 31 දිනට ශේෂය |
| --- | --- | --- |
| | | රු. |
| ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය | 6000/0/0/15/64 | 44,999 |
| ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව | 6000/0/0/15/141 | 69,132,458 |
| මිනින්දෝරු දෙපාර්තමේන්තුව | 6000/0000/00/0003/0214/000 | 115,620,045 |
| ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව | 6000/0/0/15/0/186 | 1,495,676 |
| එකතුව | | 186,293,178 |

## 2 කොටස

**එක් එක් ශීර්ෂයට අදාල විස්තරාත්මක වාර්තාව**

### 1. ශීර්ෂය 153 - ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය

### 1.1 විගණන විෂය පථය

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් මස 04 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

## 1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම

---

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරිගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 1.3 විගණන නිරීක්ෂණය

---

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඈ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

### (අ) අයවැය විචලනය

---

ප්‍රාග්ධන වැය විෂයයන් 06 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 16 සිට සියයට 100 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

### (ආ) අග්‍රිම ගිණුම්

---

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළයුතු වුවත් අවස්ථා 13 කදී ලබාදී තිබූ එකතුව රු. 189,625 ක අතුරු අග්‍රිම මාස 01 ත් මාස 06 ත් අතර කාල පමාවක් සහිතව පියවා තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව එක් මාණ්ඩලික නිලධාරියෙකු වෙත එක් වරකදී නිකුත් කළ හැකි උපරිම තත්කාර්ය අතුරු අග්‍රිමය රු. 20,000 ක් වුවද ඊට පටහැනිව අවස්ථා 04 කදී නිලධාරින් තිදෙනෙක් වෙත රු. 20,000 ක් ඉක්මවූ එකතුව රු. 207,517 ක තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබුණි.

(iii) අවස්ථා 11 කදී ලබා දී තිබුණු එකතුව රු. 153,000 ක් වූ අත්තිකාරම් මුදලින් සියයට 21 සිට සියයට 91 දක්වා පරාසයක වියදම් දරා තිබූ අතර අවස්ථා දෙකකදී ලබාගත් රු.30,000 ක අත්තිකාරම් මුදල් වියදම් නොකර සම්පූර්ණයෙන්ම ආපසු ලබා දී තිබූ බැවින් මුදල් රෙගුලාසි 371(4) හි සඳහන් විධිවිධානයන්ට අනුකූලව කටයුතුකර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 15301 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 219,710 ක් වූ අතර, එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) සේවය හැරගිය නිලධාරින් දෙදෙනෙකුගේ අයවිය යුතු වර්ෂ 08 ක් ඉක්මවූ රු. 96,928 ක ණය ශේෂය 2014 ඔක්තෝබර් 31 දින දක්වා අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

## 1.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 1.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම 2013 දෙසැම්බර් 31 දින වනවිටත් පිළියෙල කර නොතිබුණි.

## 1.5 වත්කම් කළමනාකරණය

--------------------------

**(අ) බාහිර පාර්ශවයන් වෙත දී ඇති වත්කම්**

-------------------------------------------

අමාත්‍යාංශය විසින් වාහන 25 ක් අවිධිමත් ලෙස ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ කාර්යයන් සඳහා මුදාහැර තිබූ බව නිරීක්ෂණය විය.

**(ආ) බේරුම් නොකළ බැරකම්**

------------------------------

අමාත්‍යාංශය විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු. 66,420,067 ක් විය. මේ පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

(i) වැය විෂයන් 04 ක එකතුව රු. 405,786 ක් වූ ඉතිරිවීම් ඉක්මවා බැරකම් වලට බැඳී තිබුණු බැවින් ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා ඇති බවත් සමාලෝචිත වර්ෂය අවසාන වන විට අවස්ථා 58 කදී රු. 4,343,749 ක බැරකම් වලට බැඳී තිබුණද විසර්ජන ගිණුමේ ඩී.ජී.එස්.ඒ 08 ආකෘතියේ ඒ පිළිබඳ සටහන් කර නොතිබුණු බවත් නිරීක්ෂණය විය.

(ii) අමාත්‍යාංශය විසින් 153 -02-03-04-2105 බිම්සවිය වැඩසටහන් වැය විෂයය යටතේ ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව සඳහා සමාලෝචිත වර්ෂයේ රු. 83,000,000 ක් ලබාදී තිබුණු නමුත් තවදුරටත් සමාලෝචිත වර්ෂයට අදාලව 2014 වර්ෂයේදී වියදම් දරා තිබුණු අවස්ථා 170 කට අදාළ රු. 1,617,582 වූ බැරකම් විසර්ජන ගිණුමේ දක්වා නොතිබුණි.

## 1.6 අනුකූල නොවීම්

--------------------

**(අ) නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

---------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණයවූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධිනවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති සහ රෙගුලාසිවලට යොමුව | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|

**i) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි**

**--------------------------------**

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 103(1) | - | යොමුගත රෙගුලාසි ප්‍රකාර අනතුරක් සිදුවූ වහාම අනතුර සිදු වූ ළඟම පිහිටි පොලිස් ස්ථානය වෙත දැනුම් දිය යුතු වුවද 2013 සැප්තැම්බර් 22 දින වාහනයකට සිදු වී තිබූ අනතුර දින 03 ක ප්‍රමාදයකින් පසු දැනුම් දී තිබුණි. |
| මුදල් රෙගුලාසි 104(3) 104(4) | 309,706 | අනතුර සිදු වී දින 07 ක් ඇතුළත ප්‍රාරම්භක වාර්තාවද, මාස 03 ක් ඇතුළත අවසන් වාර්තාවද ඉදිරිපත් කළ යුතු වුවද, වාහන 03 කට සිදු වී තිබූ අනතුරු සම්බන්ධයෙන් එම වාර්තා ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 104(2) | - | නැතිවීම්/පාඩුවීම් වටිනාකම රු. 50,000 ට වැඩිවන අවස්ථාවලදී එම වාර්තාවේ පිටපතක් භාණ්ඩාගාරයට යැවිය යුතු වුවත්, 2013 වර්ෂයේ සිදුවී තිබූ රු. 50,000ට වැඩි නැතිවීම්/පාඩුවීම් අවස්ථා 06 ක් සම්බන්ධයෙන් භාණ්ඩාගාරයට වාර්තා කර නොතිබුණි. |
| මුදල් රෙගුලාසි 113(4) | - | රාජ්‍ය ආදායම හෝ රජයට ලැබිය යුතු වෙනත් ගාස්තු හෝ අයකර ගැනීමේ හිමිකම් පෑම් අත්හැර දැමීමට අවසර දීමට අදාල ලිපි පිටපත් විගණකාධිපතිවරයා වෙත එවීමට ක්‍රියාකර නොතිබුණි. |

**1.7 කාර්ය සාධනය**

**------------------**

2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තු, සංයුක්ත සැලැස්ම, ක්‍රියාකාරී සැලැස්ම අනුව අමාත්‍යාංශයේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

**------------------------------------------------------**

(i) පසුගිය වර්ෂ දෙකද සහිතව සමාලෝචිත වර්ෂයේ බිම්සවිය වැඩසටහනේ ප්‍රගතිය පහත පරිදි විය.

| වර්ෂය | ප්‍රතිපාදනය රු. මි | වියදම රු. මි | ඉලක්කගත හිමිකම් සහතික ප්‍රමාණය | මිනුම් කරන ලද බිම් කැබලි සංඛ්‍යාව | ගැසට් කල කැබලි සංඛ්‍යාව | ලියාපදිංචි කළ සහතික ප්‍රමාණය |
|---|---|---|---|---|---|---|
| 2011 | 1,000 | 481 | 200,000 | 157,470 | 79,678 | 25,697 |
| 2012 | 1,100 | 416 | 200,000 | 124,717 | 62,130 | 26,386 |
| 2013 | 800 | 670 | 500,000 | 110,630 | 58,690 | 63,943 |
| එකතුව | **2,900** | **1,567** | **900,000** | **392,817** | **200,498** | **116,026** |

මේ පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

* 2013 වර්ෂය තුල බිම්සවිය වැඩසටහනට අදාලව දරන ලද සමස්ත වියදම රුපියල් මිලියන 670 ක් වූ අතර ඉන් මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ හා ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය සඳහා දිරි දීමනා වශයෙන් පමණක් රුපියල් මිලියන 77.7 ක් ගෙවා තිබුණි. නමුත් පසුගිය වර්ෂ තුනක දරන ලද වියදම හා සැසඳීමේදී වැඩසටහනෙහි සමස්ත ප්‍රගතිය සියයට 21.68 ක පහළ අගයක් ගෙන තිබුණි.

* 2013 වර්ෂයේ විසර්ජන පනත අනුව සහතික නිකුත් කිරීමට නියමිත ඉඩම් කැබලි ප්‍රමාණය 500,000 ක් වුවද ක්‍රියාකාරී සැලැස්මට අනුව තීරණ ලබා දී ලියාපදිංචි කර සහතික නිකුත් කිරීමට අපේක්ෂා කරන ලද ඉඩම් කැබලි ප්‍රමාණය 135,000 ක් විය. 2013 වර්ෂයේ නිකුත් කරන ලද හිමිකම් සහතික ප්‍රමාණය 63,943 ක් එනම් සියයට 47.4 ක් වූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව ප්‍රගතිය වැඩි වීමක් නිරීක්ෂණය වුවද, වාර්ෂික ඉලක්කය සමඟ සැසඳීමේදී සියයට 32.5 කින් අඩු වී තිබුණි. තවද එලෙස නිකුත් කළ සහතික අතර 2013 වර්ෂයට පෙර වර්ෂවල කටයුතු නිම නොකළ ප්‍රමාණයට අදාල සහතිකද ඇතුළත්ව තිබුණි.

* මැනුම් කටයුතු සිදු කරන තිබූ ඉඩම් වැඩි ප්‍රමාණයක් මායිම්වලට ඉඩම් හිමියන්ගේ එකඟ නොවීම, නඩු කටයුතු පැවතීම, අයිතිකරුවන් ඉදිරිපත් නොවීම

හා වෙනත් විවිධ හේතු නිසා ඉඩම් ලිපිගොනුවල ඉදිරි කටයුතු කරගෙන යා නොහැකිව තිබූ අතර එම ලිපිගොනු සම්බන්ධයෙන් ගත හැකි ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳවද අවධානය යොමු වී නොතිබුණි.

* සමාලෝචිත වර්ෂයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් මනින ලද ඉඩම් කැබලි සංඛ්‍යාව 110,630 ක් වුවද තීරණ ප්‍රසිද්ධ කරන ලද ඉඩම් කැබලි සංඛ්‍යාව 58,690 ක්ද රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලයට යවන ලද ඉඩම් කැබලි සංඛ්‍යාව 52,542 ක්ද බව විගණනයේදී නිරීක්ෂණය විය.

(ii) 2013 වර්ෂයේ කාර්ය සාධන වාර්තාවෙහි උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂමේ උතුරු හා නැගෙනහිර පළාත්වල යුද්ධයෙන් අවතැන් වූවන් නැවත පදිංචි කිරීමට අදාල ඉඩම් ගැටළු විසඳීම සම්බන්ධයෙන් වූ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ඇතුළත් කර නොතිබුණු අතර ඒ පිළිබඳ පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

* 2013 වර්ෂයේ උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රතිපාදනය කර තිබුණු රු මිලියන 400 න් රු. මිලියන 39.7 ක් පමණක් උතුරු හා නැගෙනහිර පළාත්වල යුද්ධයෙන් අවතැන් වූවන් නැවත පදිංචි කිරීමට අදාල ඉඩම් ගැටළු විසඳීම සඳහා වියදම් කර තිබුණි.

කොමිසමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය පහත පරිදි වේ.

| | ඉල්ලීම් ලැබුණු ප්‍රමාණය | විසඳූ ප්‍රමාණය | විසඳීමට ඉතිරිව ඇති ප්‍රමාණය | විසඳූ ප්‍රමාණය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| පදිංචිය සඳහා ඉඩම් ඉල්ලීම් | 96,060 | 16,181 | 79.879 | 16.8 |
| ලේඛන නියමානුකූල කිරීම | 31,621 | 2,471 | 29,150 | 7.8 |

| | | | | |
|---|---|---|---|---|
| අනෙකුත් ඉඩම් ගැටළු | 27,372 | 4,593 | 22,779 | 16.8 |
| **එකතුව** | **155,053** | **23,245** | **131,808** | **14.9** |

මේ අනුව නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ සමස්ත ප්‍රගතිය සියයට 14.9 ක් තරම් වූ පහළ මට්ටමක පවතින බව විගණනයේදී නිරීක්ෂණය විය.

(iii) රජයේ කටයුතු වෙනුවෙන් ඉඩම් අත්පත් කරගැනීමට 2013 වර්ෂය සඳහා රු. මිලියන 1,300 ක් ප්‍රතිපාදනය කර තිබුණු අතර ඉන් රු. මිලියන 1,252 ක් වියදම් දරා තිබූ නමුත් එක් එක් දිස්ත්‍රික්කවල ඉඩම් අත්පත් කරගැනීමේ ප්‍රගතිය කාර්යසාධන වාර්තාවෙහි දක්වා නොතිබුණි.

(iv) අමාත්‍යාංශයේ 2008 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලපරිච්ඡේදයට අදාල දැනට ක්‍රියාත්මක වන ඉඩම් අත්පත් කර ගැනීමේ ලිපිගොනු සංඛ්‍යාව 1,563 ක් වූ අතර ඉන් 1,207 ක් 2013 වර්ෂයට අදාල ලිපිගොනු විය. තවද වන්දි ගෙවා වැඩ අවසන් කර ඇති ගොනු ගණන 76 ක් වූ අතර අත්හැර දැමූ ලිපිගොනු ගණන 79 ක් විය.

**(ආ) සැලැසුම් කිරීම**

-----------------

**(i) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම**

-----------------------------------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

* 2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මෙහි බිම් සවිය වැඩසටහන ක්‍රියාත්මක කිරීම හා ඉඩම් අත්පත් වන්දි අංශයේ කාර්යයන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ හැර අමාත්‍යාංශයේ අනෙකුත් ප්‍රධාන කාර්යයන්ට අයත් වන්නා වූ ඉඩම් ප්‍රතිපත්ති සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම, රජයේ ඉඩම් කළමනාකරණය, ප්‍රශස්ත මැනුම් සිතියම්කරණය හා මැනුම් තොරතුරු සේවාවන්, ඉඩම් පරිහරණ සැලසුම් සකස් කිරීම හා ක්‍රියාත්මක කිරීම, ඉඩම් සම්බන්ධ ජාතික දත්ත පද්ධතිය ක්‍රියාත්මක කිරීම යන අමාත්‍යාංශ කටයුතු පිළිබඳව නිසි අවධානයක් යොමු කර සැලසුම් පිළියෙල කර නොතිබූ හෙයින් කාර්යසාධන වාර්තාවේ ප්‍රගතිය ක්‍රියාකාරී සැලැස්ම සමඟ සැසඳිය නොහැකි විය.

* 2013 වර්ෂයේ අමාත්‍යාංශයේ ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ඉලක්කයන් ඇතුළත් කර නොතිබුණි.

* අමාත්‍යාංශය ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීමේදී ඇතැම් ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් අමාත්‍යාංශය යටතේ ඇති අනෙකුත් දෙපාර්තමේන්තුවල ක්‍රියාකාරී සැලසුම් පිළිබඳ නිසි අවධානයක් යොමු කර නොතිබුණි. ඒ නිසා අමාත්‍යාංශ ඉලක්ක හා දෙපාර්තමේන්තු ඉලක්ක අතර පහත දැක්වෙන පරිදි පරස්පරතාවයන් පැවති බැව් නිරීක්ෂණය විය.

| දෙපාර්තමේන්තුව | ක්‍රියාකාරකම | ඉලක්කය<br>අමාත්‍යාංශය අනුව | <br>දෙපාර්තමේන්තුව අනුව |
|---|---|---|---|
| ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව | විමර්ශනය කිරීමට අපේක්ෂිත කැබලි ගණන | 135,000 | 224,280 |
| | හිමිකම් සහතික නිකුත් කිරීමට අපේක්ෂිත ප්‍රමාණය | 135,000 | 134,568 |
| මිනින්දෝරු දෙපාර්තමේන්තුව | මැනුම් කිරීමට අපේක්ෂිත බිම් කැබලි සංඛ්‍යාව | 147,000 | 184,500 |

## 1.8 අවිධිමත් ගනුදෙනු

බිම් සවිය වැඩසටහන පිළිබඳව දැනුවත් කිරීමේ අරමුණින් 2013 වර්ෂයේ දැයට කිරුළ ප්‍රදර්ශනයේදී බෙදා දීමට අත් පත්‍රිකා 150,000 ක් මුද්‍රණය කරවා ගැනීම සඳහා අතිරේක ලේකම් (බිම්සවිය) ගේ 2013 පෙබරවාරි 05 දිනැති ලිපිය මඟින් අවම මිල ඉදිරිපත් කර තිබූ ආයතනය වෙත 2013 මාර්තු 01 දිනට පෙර අදාළ අත් පත්‍රිකා තොගය මුද්‍රණය කර අමාත්‍යාංශය වෙත භාර දෙන ලෙස දන්වා තිබුණද එම මිල ගණන් සඳහා ප්‍රසම්පාදන කමිටුවේ ආවරණ අනුමැතිය අයදුම් කර තිබුණේ 2013 මැයි 07 දින විය. ඒ අනුව ප්‍රසම්පාදන අවශ්‍යතාවයන් නිසි කාලය තුළ හඳුනා නොගෙන ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතිය ලබා ගැනීමට පෙර මිලදී ගැනීම සිදුකර තිබූ බව නිරීක්ෂණය විය.

## 1.9 පාඩු හා හානි

නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) ඩී.ජී.එස්.ඒ. 7 හා 7(I) ආකෘතිවල වර්ෂය තුල සිදුවූ හානි හා පාඩු ලෙස පිළිවෙලින් රු.2,137,534 හා 233,915 ක් වූ වටිනාකම් 2012 වර්ෂයට අදාල වූ අතර 2013 වර්ෂයේ හානි හා පාඩු සිද්ධි 07 ක වටිනාකම රු. 1,343,799 ක් වුවද ඒ පිළිබඳව ඩී.ජී.එස්.ඒ. 7 හා 7(I) ආකෘතීන් වල දක්වා නොතිබුණි.

(ආ) 2013 දෙසැම්බර් 18 දින අනතුරට ලක් වූ වාහනයක් රු. 71,721 කට අළුත්වැඩියාවක් සිදු කරගෙන තිබූ අතර රක්ෂණ වන්දි ලෙස රක්ෂණ ආයතනයෙන් ප්‍රතිපූර්ණය කර තිබුණේ රු. 64,037 ක් වූ බැවින් රු. 7,684 ක පාඩුවක් සිදු වී තිබුණි.

## 1.10 කළමනාකරණ දූර්වලතා

---------------------------

නියැදි විගණන පරීක්ෂණවලදී පහත සඳහන් දූර්වලතා නිරීක්ෂණය විය.

(අ) 2010 මැයි 14 දිනැති අංක සීඒ/1/17/1 දරන ජනාධිපති ලේකම්වරයාගේ රාජ්‍ය වියදම් කළමණාකරණය මැයෙන් වූ ලිපියේ 03 වන වගන්තිය අනුව අමාත්‍යවරුන්ගේ පරිහරණය හා ආරක්ෂක කටයුතු වෙනුවෙන් වෙන් කරනු ලබන උපරිම නිල වාහන සංඛ්‍යාව 03 කට සීමා කර තිබුණද එම විධි විධානයන්ට පටහැනිව අමාත්‍යාංශය විසින් විෂයභාර අමාත්‍යවරයා වෙත නිල වාහන 08 ක් අනුයුක්ත කර තිබුණි.

(ආ) 2013 වර්ෂය තුල අමාත්‍යාංශය හා ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු වල සේවය කරන ශ්‍රී ලංකා පරිපාලන සේවයේ 2010 සහ 2011 කණ්ඩායම් වල නිලධාරීන් සඳහා මාසික ප්‍රබුද්ධ සංවාද මණ්ඩපය නම් වූ වැඩමුළු 09 ක් සඳහා රු. 540,000 ක් පමණ වූ මුදලක් වැය කර තිබුණි. එම වැඩසටහන් වලට සහභාගි වූ නිලධාරීන්ට 2013 වර්ෂය තුලදී වැඩමුළුවට අදාල නොවන, වර්ග 30 කින් ග්‍රන්ථ 203 ක් පමණ බෙදා දී තිබූ අතර ඒ සඳහා රු. 292,565 ක් අමාත්‍යාංශයේ පුහුණු වැඩසටහන් වලට වෙන්කර තිබූ ප්‍රතිපාදනවලින් වැය කර තිබුණි. තවද ග්‍රන්ථ ලබාගත් නිලධාරීන්ගේ නාමලේඛන නිසිපරිදි යාවත්කාලීනව පවත්වාගෙන ගොස් නොතිබුණු අතර ලබාදී තිබුණු නවකථා සහ කෙටිකථා වැනි ග්‍රන්ථවල ස්වභාවයන් අනුව එයින් ලබා ගැනිමට අපේක්ෂිත ප්‍රතිඵල කුමක්ද යන්නත් විගණනයට පැහැදිලි කර නොතිබුණි.

## 1.11 මානව සම්පත් කළමනාකරණය

-------------------------------------

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

------------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 20 | 17 | 03 |
| (ii) තෘතියික මට්ටම | 06 | 05 | 01 |
| (iii) ද්විතියික මට්ටම | 420 | 392 | 28 |
| (iv) ප්‍රාථමික මට්ටම | 48 | 44 | 04 |
| එකතුව | 494 | 458 | 36 |

සමාලෝචිත වර්ෂය අවසානය වන විට පුරප්පාඩු 36 ක් පිරවීමට අමාත්‍යාංශය කටයුතු කර නොතිබුණි.

## 2. ශීර්ෂය 286 - ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව

### 2.1 විගණන විෂය පථය

ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් 17 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සෙයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 2.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ හා ගණන් දීමේ නිලධාරීගේ වගකීම

විසර්ජන ගිණුම ආදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

## 2.3 විගණන නිරීක්ෂණය

------------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 2.4 සිට 2.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

--------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) වැය විෂයයන් 06 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරිමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 සිට සියයට 89 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

(ii) බදුකුලී හා පළාත් පාලන ආයතන බදු සඳහා බොහෝ විට නිශ්චිත වශයෙන් ඇස්තමේන්තු සකස් කළ හැකි වුවත් වැය විෂයය අංක 286-02-01-1404 යටතේ ඒ සඳහා රු. 1,215,000 ක ශුද්ධ ප්‍රතිපාදන මුදලක් වෙන්කරගෙන තිබුණු අතර වර්ෂය අවසානයේ රු. 584,795 ක් හෙවත් සියයට 48 ක් ප්‍රතිපාදන ඉතිරිවී තිබුණි. අපේක්ෂා කල පරිදි වියදම් පැන නොනැගීම ඉතිරිවීමට හේතු ලෙස දක්වා තිබුණි.

**(ආ) අග්‍රිම ගිණුම**

------------

මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුතු වුවත් අවස්ථා 21 කදී කාර්යය නිම වී දින 26 සිට 66 දක්වා කාල ප්‍රමාදයකින් පසුව තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කර තිබුණු අතර දැරීමට සිදුවන වියදම පිළිබඳව නිසි පුරෝකථනයකින් තොරව කටයුතු කිරිම හේතුවෙන් අවස්ථා 16 කදී

ලබාගෙන තිබූ අත්තිකාරම් මුදලින් පියවීමට තිබූ ඉතිරිය සියයට 23 සිට සියයට 66 දක්වා පරාසයක පැවතුණි.

**(ඈ) ආදායම් ගිණුම්**

---------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂය සඳහා සංකේත අංක 20.02.01.03 සඳහා රු.මිලියන 35 ක ආදායම් ඇස්තමේන්තු කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී එකතුව රු.මිලියන 50 ක් එනම් ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 143 ක් රැස්කර තිබුණි.

(ii) ඉදිරිපත් කළ ආදායම් ගිණුම් අංක 20.02.01.03 ට අනුව එකතුව රු. 11,818,745 ක ආදායම් හිඟහිට තිබුණු අතර එම හිඟහිටි ආදායම වර්ෂ 01 සිට වර්ෂ 03 ක් අතර කාල පරාසයකට අදාල විය. එම හිඟහිටි ආදායම අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පවතුණි.

(iii) මු.රෙ 85(1) (ඈ) හා 2002 ජුලි 17 දිනැති අංක 01/2002 දරන රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු චක්‍රලේඛය මඟින් ආදායම් හැකිතාක් දුරට නිවැරදිව පුරෝකථනය කළයුතු බවට නියමකර තිබූ අතර 2014 ජනවාරි 07 දිනැති රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ අංක 235/2013 හි 04.1 ඡේදය මගින්ද මේ සම්බන්ධයෙන් අවධානය යොමුකරන ලෙස සියළුම ගණන්දීමේ නිලධාරීන් දැනුවත් කර තිබූණි. ඉකුත් වර්ෂ 5 ක ආදායම් ඇස්තමේන්තු හා තත්‍ය ආදායම් පිළිබඳ පරීක්ෂාවේදී දෙපාර්තමේන්තුව දිගින් දිගටම ඌන ආදායම් ඇස්තමේන්තු පිළියෙල කර තිබූ බව අනාවරණය විය. විස්තර පහත දැක්වේ.

| වර්ෂය | ආදායම් ඇස්තමේන්තුව (රු.) | තත්‍ය ආදායම (රු.) | ඇස්තමේන්තුව ඉක්මවා රැස්කර තිබුණු ආදායම (රු.) | ඇස්තමේන්තුව ඉක්මවා රැස්කර තිබුණු ආදායම ඇස්තමේන්තුවේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| 2008 | 11,543,976 | 18,709,654 | 7,165,678 | 62 |

| | | | | |
|---|---|---|---|---|
| 2009 | 10,699,290 | 23,084,289 | 12,384,999 | 115 |
| 2010 | 15,000,000 | 17,425,204 | 2,425,204 | 16 |
| 2011 | 16,000,000 | 28,854,745 | 12,854,745 | 80 |
| 2012 | 25,000,000 | 34,690,642 | 9,690,642 | 39 |
| 2013 | 35,000,000 | 49,503,519 | 14,503,519 | 41 |

(iv) දෙපාර්තමේන්තුව විසින් දිවයිනේ රජය සතු මුළු ඉඩම් ප්‍රමාණය, බදු දී ඇති මුළු ඉඩම් ප්‍රමාණය හා ආදායම අයවන ආකාරය පිළිබඳ තොරතුරු ඇතුළත් ලේඛන පවත්වාගෙන ගොස් නොතිබුණු බැවින් වර්ෂයේ ආදායම, එකතු කල යුතු ශුද්ධ ආදායම හා හිඟ ආදායම නිවැරදිද යන්න තහවුරු කරගැනීමට හෝ අයකර ගැනීම් පිළිබඳ තත්ත්වය නිවැරදිද යන්න තහවුරු කරගත නොහැකි විය.

**(ඈ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම් පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

-----------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 28601 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 2,922,487 ක් වූ අතර එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) 2013 දෙසැම්බර් 31 දිනට රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් 'බී' ගිණුමේ ශේෂය රු.50,532,945 ක් වුවද භාණ්ඩාගාර මුද්‍රිත සටහන අනුව ශේෂය රු 50,738,733 ක් වුයෙන් රු. 205,788 ක වෙනසක් නිරීක්ෂණය විය.

**2.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

-------------------------------------

**2.4.1 බේරුම් නොකළ බැරකම්**

--------------------------

දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.2,931,340 ක් වූ අතර, ඒ සියල්ල වර්ෂ 01 ට අඩු ඒවා විය. තවද අවස්ථා 11 කට අදාල රු. 192,424 ක් වූ බැරකම් 2013 වර්ෂයේ විසර්ජන ගිණුමේ ඩී.ජී.එස්.ඒ.08 ආකෘතිය යටතේ දක්වා නොතිබුණි.

## 2.5 අනුකූල නොවීම්

--------------------

**(අ) නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

----------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණවලදි නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසි වල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති,රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| **(i) <u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ</u>.** | |
| 2008 ජුනි 01 දිනැති අංක 2008 / 13 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 1.3.1 (1) ඡේදය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව කණ්ඩායම් ප්‍රවාහන පහසුකම් හිමි නොවන නිලධාරීන් සඳහා ප්‍රවාහන පහසුකම් සපයා තිබුණු අතරම ගමන් ස්ථාන දෙක අතර යාමට සහ ඒමට කිලෝමීටර් 50 ක සීමාව ඉක්මවා ප්‍රවාහන පහසුකම් සපයා තිබුණි. |
| **(ii) <u>අමාත්‍යාංශ චක්‍රලේඛ</u>** | |
| 2010 මාර්තු 24 දිනැති අංක 02/2010 දරන අමාත්‍යාංශ චක්‍රලේඛය<br>(i) 01, 03,04,05 ඡේද | වාහන චක්‍රලේඛ විධිවිධාන නොසලකා කණ්ඩායම් ප්‍රවාහනය සඳහා යොදවා තිබූ ඇතැම් වාහනවල මයිලෝ මීටර් ක්‍රියාවිරහිතව තිබියදීත් ප්‍රවාහනයේ යොදවා තිබුණු අතර ඇතැම් වාහනවලට අදාල ධාවන සටහන්පත් විධිමත්ව පවත්වාගෙන ගොස්ද නොතිබුණි. |

## 2.6 කාර්යසාධනය

------------------

2013 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ)** කාර්යසාධන වාර්තාවේ දැක්වෙන එක් එක් කටයුත්තෙහි වාර්ෂික ඉලක්ක ඇතුළත් කර නොතිබුණි.

**(ආ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

------------------------------------------------

අන්තර් පළාත් වාරිමාර්ග ඉඩම් සංවර්ධන ව්‍යාපෘති සහ පළාත් මට්ටමින් රජයේ ඉඩම් ගැටළු විසඳීමේ වැඩසටහන යටතේ සමාලෝචිත වර්ෂයේ ගැටළු 1500 ක් විසඳීමට ක්‍රියාකාරී සැලැස්ම අනුව තීරණය කර තිබුණද විසඳා තිබුණේ ගැටළු 1246 ක් පමණි. තවද පසුගිය වර්ෂය අවසානයේ විසඳීමට ගැටළු 2143 ක් පැවති අතර මේ වර්ෂයේ 4862 ක් සමඟ 2013 වර්ෂයේ මුළු ගැටළු සංඛ්‍යාව 7005 ක් වූයෙන් වසර තුල පැවති ගැටළු සංඛ්‍යාවෙන් විසඳීමට කටයුතු කර තිබුණේ සියයට 18 ක් තරම් සුළු ප්‍රමාණයක් පමණි.

**(ඇ) සැලසුම් කිරිම**

-----------------

**වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම**

---------------------------------------------------------------

පහත සඳහන් අවස්ථාවලදී ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

(i) **ඉඩම් සංවර්ධන අඥා පනත යටතේ දීමනා පත්‍ර නිකුත් කිරීම**

----------------------------------------------------------------

රන්බිම දීමනා පත්‍ර 30,000 ක් දිමට සැලසුම් කර තිබුණද කාර්යසාධන වාර්තාවේ එම ප්‍රමාණය 10,000 ක් ලෙස දක්වා තිබුණි. මේ අතර සමාලෝචිත වර්ෂයේ නිකුත් කර තිබුණේ රන්බිම දීමනා පත්‍ර 6582 ක් පමණි.

(ii) **ඉඩම් සංවර්ධන අඥා පනත හා ඉඩම් නිදහස් කිරිමේ අඥා පනත යටතේ දීමනා පත්‍ර ලබාදීම.**

**------------------------------------------------------------------------------------**

**----**

ඉඩම් සංවර්ධන අඥා පනත යටතේ මධ්‍යම පාන්තික දීමනා පත්‍ර 45 ක් ලබා දිමට වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්ක කොට තිබුණද සමාලෝචිත වර්ෂයේදි දීමනා පත්‍ර 19 ක් පමණක් ලබා දි තිබුණි.

(iii) **රේඛා චිත්‍ර ලබාදීම**

**------------------**

2013 වර්ෂයට අදාල රේඛා චිත්‍රවලට අදාල සම්පූර්ණ තොරතුරු විගණනයට ඉදිරිපත් නොවුනු අතර ප්‍රාදේශීය ලේකම් කාර්යාල 41 ක තොරතුරු අනුව රේඛා චිත්‍ර නිකුත් කිරීමේ ප්‍රගතිය පහල මට්ටමක පැවතුනි.

| **වර්ෂය** | **ඉදිරියට ගෙනා රේඛා චිත්‍ර ප්‍රමාණය** | **රේඛා චිත්‍ර ඉල්ලීම් ප්‍රමාණය** | **ලැබුණු රේඛා චිත්‍ර ප්‍රමාණය** | **දීමනාපත්‍ර සකස් කිරීමට ඇති මුළු රේඛා චිත්‍ර ප්‍රමාණය** | **දීමනාපත්‍ර සකස් කල රේඛා චිත්‍ර ප්‍රමාණය** | **දීමනාපත්‍ර සකස් කල නොහැකි රේඛා චිත්‍ර ප්‍රමාණය** | **දීමනා පත්‍ර සකස් කිරීමට ඉතිරිව ඇති ඉතිරි රේඛා චිත්‍ර ප්‍රමාණය** |
|---|---|---|---|---|---|---|---|
| 2013 | 5,717 | ඉදිරිපත් නොවුණි | 853 | 6,570 | 1,003 | 1,338 | 4,229 |

**2.7 අවිධිමත් ගනුදෙනු**

**----------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

**------------------------------------------------------------**

පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුව විසින් ලීබඩු උපකරණ මිලදී ගැනීම සඳහා අනුමැතිය ලබා දී තිබුණද ගිවිසුම් අත්සන් කිරීම සඳහා තීරණය කළ වකවානුවේ ගිවිසුම් අත්සන් කර නොතිබුණි.

(ii) අවශ්‍යතා ලේඛණයේ සඳහන් අයිතම 05 කට අදාල ලීබඩු උපකරණ 54 ක් අවශ්‍ය ප්‍රමාණයන් ඉක්මවා මිලදි ගෙන තිබුණු අතර නියමිත කාලසීමාවට වඩා ප්‍රමාද වී සපයන ලද ලීබඩු උපකරණ සඳහා ප්‍රමාද දින ගණන වෙනුවෙන් කිසිදු මුදලක් අයකර නොතිබුණු අතර කොන්ත්‍රාත් පිරිනැමීමේදී ඉහත කොන්දේසි සහ පිරිවිතර වලට අනුකූල නොවන හෝ ගුණත්වයෙන් අඩු භාණ්ඩ සපයා ඇති අවස්ථාවක එකී භාණ්ඩ සැපයීම සම්බන්ධයෙන් අනුගමනය කරන පටිපාටිය කොන්ත්‍රාත් කොන්දේසි ගිවිසුමට ඇතුලත් කර නොතිබුණු බවද නිරීක්ෂණය විය.

(iii) 2013 වර්ෂයේ මිලදීගත් භාණ්ඩ අයිතම 355ක් 2014 මැයි 31 දින වනවිටත් නියෝජ්‍ය ඉඩම් කොමසාරිස් කාර්යාල අතර බෙදා හැර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**(ආ) බිම්සවිය වැඩසටහන යටතේ දිරි දීමනා ගෙවීම**

**------------------------------------------------------**

බලපත්‍ර, දීමනා පත්‍ර සහ දීර්ඝකාලීන බලපත්‍ර නිකුත් කිරීම සඳහා මෙම දිරිදීමනා ක්‍රමය යටතේ 2012 වර්ෂයට අදාලව 2013 වර්ෂයේ ප්‍රධාන කාර්යාලයට පමණක් රු. 1,186,240 ක් දිරිදීමනා වශයෙන් ගෙවා තිබුණු අතර එහිදී සමස්ත වටිනාකමෙන් සියයට 70 ක් එනම් රු. 826,995 ක් නිලධාරීන් තිදෙනෙකු අතර බෙදී ගොස් තිබුණි. මේ පිළිබඳව පහත සඳහන් කරුණු නිරීක්ෂණය විය.

(i) දීමනා පත්‍ර, බලපත්‍ර සහ දීර්ඝකාලීන බලපත්‍ර නිකුත් කිරීම දෙපාර්තමේන්තුවේ මූලික අරමුණ වන නමුත් ඉහළ කළමනාකාරීත්වයේ නිලධාරීන් කිහිපදෙනෙකු සඳහා පමණක් ඉහළ ප්‍රතිශතයක් හිමිවන ආකාරයට මෙම දිරි දීමනා යෝජනා ක්‍රමය සකස් කර තිබුණි.

(ii) ප්‍රධාන කාර්යාලයේ 173 ක් පමණ වූ සේවක මණ්ඩලයක් අතුරින් දිරිදීමනා සඳහා හිමිකම් ලබා තිබුණේ නිලධාරීන් 13 ක් පමණක් වූ අතර දීමනාව බෙදී යන ආකාරය අදාල අංශ ප්‍රධානීන්ගේ තීරණ මත රදා පැවත තිබූ හෙයින් එම නිලධාරීන් අතරද දිරිදීමනාව බෙදීයාමේ අසාමාන්‍ය විෂමතාවයක් පැවතුනි.

(iii) ඉලක්කගත ඉඩම් කැබලි සංඛ්‍යාව ඉක්මවන ලද එක් බිම් කැබැල්ලක් සඳහා රු. 640 බැගින්වූ දීමනාවක් ගෙවීමට ආයතන අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ලැබී තිබුණද සම්බන්ධිත පාර්ශව අතර දිරිදීමනාව බෙදීයා යුතු ආකාරය සම්බන්ධයෙන් අමාත්‍යාංශ ලේකම්වරයා දැනුවත් කර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

**2.8 පාඩු හා හානි**

---------------

විසර්ජන ගිණුමේ ඩී.ජී.එස්.ඒ.7 ආකෘතිය අනුව 2013 දෙසැම්බර් 31 දිනට රු. 987,042 ක් වූ තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට හෝ අත්හැරීමට ඇති සිද්ධි 05 න් රු. 700,164 ක් වූ සිද්ධි 02 ක් වසර 03 කට වැඩි වූ අතර එය අය කරගැනීමට හෝ කපාහැරීමට 2014 මැයි 31 දින වනවිටත් ප්‍රමාණවත් පියවර ගෙන නොතිබුණි.

**2.9 කළමනාකරණ දූර්වලතා**

--------------------------

**(අ) කිරිදිඔය නිවාස ණය ව්‍යාපෘතිය**

---------------------------------

1993 වර්ෂයේ කිරිදිඔය නිවාස ණය ව්‍යාපෘතිය යටතේ ජනපදිකයින් 1436 ක් සඳහා සහනාධාර ක්‍රමය යටතේ රු. 11,603,000 ක ණය ලබා දී තිබූ අතර 2013 වර්ෂය අවසානයට පැවති තත්ත්වය හා අයකර ගැනීම පිළිබඳ විස්තර පහත පරිදි වේ.

(i) වසර 20 ක් පමණ කාලයකදී ඉහත ණය මුදලින් සියයට 68 ක් එනම් රු.7,850,425 ක් පමණක් අය වී තිබූ අතර 2013 වර්ෂය අවසානයට රු. 3,752,575 ක් එනම් සියයට 32 ක හිඟ ණය ශේෂයක් විය.

(ii) 2013 වර්ෂයේ සියයට 3 ක් තරම් අඩු ණය ප්‍රමාණයක් අයකරගෙන තිබූ අතර ණය අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දූර්වල තත්වයක පැවතුණි.

**(ආ) නිල නිවාස**

-------------

නිල නිවාසවල පදිංචියේ ස්වභාවය පහත පරිදි විය.

**පදිංචියේ ස්වභාවය හිස්ව පවතින**

| ප්‍රාදේශීය කාර්යාලය | කුලී අයවන | කාර්යාල පවත්වා ගෙන යන | අලුත් වැඩියා කළ යුතු | විනාශ වෙමින් පවතින | අනවසර | වෙනත් ආයතනවලට ලබාදී ඇති | මුළු සංඛ්‍යාව |
|---|---|---|---|---|---|---|---|
| මොණරාගල | 6 | 0 | 1 | 3 | 0 | 4 | 14 |
| කන්තලේ | 2 | 0 | 4 | 0 | 0 | 0 | 6 |
| ත්‍රිකුණාමලය | 5 | 0 | 0 | 3 | 0 | 4 | 12 |
| දෙබරවැව | 21 | 0 | 6 | 0 | 0 | 3 | 30 |
| මහියංගනය | 6 | 9 | 7 | 4 | 3 | 12 | 41 |
| අම්පාර | 8 | 1 | 11 | 3 | 7 | 12 | 42 |
| පොළොන්නරුව | 32 | 3 | 10 | 2 | 7 | 9 | 63 |
| අනුරාධපුරය | 11 | 17 | 23 | 14 | 12 | 14 | 91 |
| **එකතුව** | **91** | **30** | **62** | **29** | **29** | **58** | **299** |

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) දෙපාර්තමේන්තුව සතුව පවතින නිල නිවාස 299 න් කුලී අයවන නිවාස සංඛ්‍යාව 91 කි. එනම් මුළු නිවාස සංඛ්‍යාවෙන් සියයට 30 කින් පමණක් කුලී අයවන බැවින් නිවාස කුලී අයකිරීම ඉතාම දුර්වල තත්වයක පැවතුණි.

(ii) ඉතිරි නිල නිවාස 208 න් නිල නිවාස 62 ක් අළුත්වැඩියා කළයුතු තත්වයේ ඒවාද 29 ක් විනාශ වෙමින් පවතින ඒවාද වූයේන් මුළු නිල නිවාසවලින් සියයට 30 ක්ම නිෂ්කාර්යයව පැවතුණි.

(iii) තවද අනවසර පදිංචිකරුවන් නිල නිවාස 29 ක පදිංචිව සිටින අතර එම නිල නිවාසවලින් එම පුද්ගලයන් ඉවත් කිරීමට කටයුතු කර නොතිබුණ අතර ඒවායෙන් කිසිදු ආදායමක් ඉපයීමටද කටයුතු කර නොතිබුණි.

## 2.10 මානව සම්පත් කළමනාකරණය

### (අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෂ්ඨ මට්ටම | 48 | 29 | 19 |
| (ii) | තෘතියික මට්ටම | 38 | 14 | 24 |
| (iii) | ද්විතියික මට්ටම | 695 | 428 | 267 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 119 | 81 | 38 |
| | **එකතුව** | **900** | **552** | **348** |

**3. ශීර්ෂය -287 -ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව**

---

**3.1 විගණන විෂය පථය**

ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් 04 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සෙයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**3.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරිගේ හා ගණන් දීමේ නිලධාරිගේ වගකීම**

----------------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුමහා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**3.3 විගණන නිරීක්ෂණය**

------------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 3.4 සිට 3.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

--------------------

වැය විෂයයන් 03 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 53 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ආ) වෙනත් අමාත්‍යාංශ හා දෙපාර්තමේන්තු විසින් ලබා දුන් ප්‍රතිපාදන උපයෝජනය**

-------------------------------------------------------------------------------------

බිම්සවිය වැඩසටහන සඳහා ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය විසින් එකතුව රු.83,000,000 ක් වූ ප්‍රතිපාදන ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණු අතර එම ප්‍රතිපාදන වලින් එකතුව රු.66,286,951 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.16,713,049 ක් එනම් සියයට 20 ක් ඉතිරි වී තිබුණි.

**(ඇ) අග්‍රිම ගිණුම්**

------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) මුදල් රෙගුලාසි 371 ප්‍රකාරව කාර්යය නිමකළ වහාම ලබාගත් තත්කාර්ය අතුරු අග්‍රිමය නිරවුල් කළ යුත් වුවත්, අවස්ථා 29 කදී අදාල කාර්යය නිමවී දින 21 සිට දින 160 ක ප්‍රමාදයකින් පසුව රු. 446,972 ක අතුරු අග්‍රිම නිරවුල් කර තිබුණි.

(ii) මුදල් රෙගුලාසි 371 (4) හි සඳහන් විධිවිධානයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කිරීම හේතුවෙන් අවස්ථා 4 කදී ලබාදී තිබූ එකතුව රු.39,491 ක් වූ අත්තිකාරම් මුදල සම්පූර්ණයෙන්ම ආපසු පියවා තිබූ අතර අවස්ථා 02 කදී ලබාදී තිබූ රු.40,000 ක අත්තිකාරම් මුදලින් සුළු ප්‍රමාණයක් පමණක් වියදම් කර පියවා තිබුණි. ඒ අනුව තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදී කටයුතු ඉටුකර ගැනීමේදී මුදල් රෙගුලාසි 71 විධිවිධාන නොසලකා කටයුතු කර ඇති බව නිරීක්ෂණය විය.

**(ඇ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

---------------------------------------------------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) විෂය අංක 28701 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවීම් හිඟහිට තිබුණු ශේෂවල එකතුව රු. 947,376 ක් විය. එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසු විපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

(ii) 2013 දෙසැම්බර් 31 දිනට කේවල ශේෂ වර්ගීකරණ සාරාංශයේ එකතුව හා දෙපාර්තමේන්තු පාලන ගිණුම අතර රු. 9,913 ක වෙනසක් නිරීක්ෂණය වු අතර එම වෙනසට හේතු අනාවරණය නොවීය.

(iii) එක් නිලධාරියෙකුගේ විශේෂ, උත්සව හා ආපදා ණය ශේෂයන් පිළිවෙලින් රු.1,250, රු. 3,500 ක් හා රු.92,430 ක් වූ අතර 2013 ජූලි මාසයේ සිට එම නිලධාරියාගෙන් වාරික මුදල් අයකරගෙන නොතිබුණි.

**3.4 යහ පාලනය හා ගිණුම් කටයුතු භාවය**

**-----------------------------------**

**3.4.1 අභ්‍යන්තර විගණනය**

-------------------------

දෙපාර්තමේන්තුව තුළ අභ්‍යන්තර විගණන ඒකකයක් ස්ථාපිත කර නොතිබුණු අතර අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන ඒකකය විසින් ද ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

**3.5 වත්කම් කළමනාකරණය**

**-------------------------**

**(අ) බේරුම් නොකළ බැරකම්**

**-------------------------**

(i) වැය විෂයයන් 02 කට අදාලව රු. 388,859 ක ඉතිරිවීම් ඉක්මවා බැරකම් වලට බැඳී තිබුණු බැවින් ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා ඇති බව නිරීක්ෂණය විය.

(ii) සමාලෝචිත වර්ෂය අවසාන වනවිට අවස්ථා 10 කදී රු. 188,169 ක බැරකම් වලට බැඳී තිබුණු අතර විසර්ජන ගිණුමේ ඩී.ජී.එස්.ඒ. 8 ආකෘතියේ ඒ පිළිබඳ සටහන්කර නොතිබුණි.

**3.6 කාර්ය සාධනය**

**----------------**

2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තු සංයුක්ත සැලැස්ම ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**(අ) ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

**------------------------------------------------**

1931 ඔක්තෝබර් 23 දිනැති ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත අනුව දෙපාර්තමේන්තුව ප්‍රධාන කාර්යයන් ප්‍රමාණවත් ලෙස ඉටු කර නොතිබුණු අතර එසේ නිරීක්ෂණය වූ අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

(i) 1931 ඔක්තෝබර් 23 දිනැති ඉඩම් නිරවුල් කිරීමේ ආඥා පනත අනුව දෙපාර්තමේන්තුවේ මූලික අරමුණ වන්නේ උරුම අයදුම්පත් කැඳවීම, විමර්ශන කටයුතු සිදු කිරීම සහ ගම් නිදහස් කිරීම ඇතුළු කටයුතු සිදුකිරීම වන අතර නිරවුල් කිරීමට කටයුතු කරමින් පවතින ගම් පිළිබඳව තත්ත්වය පහත පරිදි වේ.

| විස්තරය | ගම් සංඛ්‍යාව |
|---|---|
| නිරවුල් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින | 70 |
| අවසාන වාර්තාව සකස් කරමින් පවතින | 06 |
| උතුරු නැගෙනහිර පළාත්වල දැන්වීම් ප්‍රසිද්ධ කර ඇති | 30 |
| දැන්වීම් ප්‍රසිද්ධ කර ඇතත් ලේඛන අස්ථානගත වී ඇති | 57 |
| අවසන් වාර්තාව නිකුත් කරන ලද | 25 |
| **එකතුව** | 188 |

පහත කරුණු නිරීක්ෂණය කෙරේ.

* ප්‍රසිද්ධ කර ඇතත් ලේඛන අස්ථානගතවී ඇති ගම් 57 ක් සම්බන්ධයෙන් කටයුතු කිරීම අවිනිශ්චිත තත්ත්වයක පැවතුණි.

(ii) නිරවුල් කිරීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින ගම් 70 ක් සම්බන්ධයෙන් තත්ත්වය පහත පරිදි විය.

| කාර්ය සාධනය | කාර්ය ඉටු කිරීම (ගම් සංඛ්‍යාව) |
|---|---|
| ඉඩම් කැබලි මැන වෙනස් කිරීම් මැනුම්පති වෙත යැවීම | 05 |
| ඉඩම් කැබලි මැන වෙනස් කිරීම හා නිරවුල් ආඥා සඳහා විධාන පිළියෙල කිරීම | 37 |
| නිරවුල් කිරීමේ ආඥා ඉඩම් රෙජිස්ට්‍රාර් වෙත යැවීම | 09 |
| නිරවුල් කිරීමේ ආඥා අමාත්‍යාංශය වෙත යැවීම | 03 |
| නිරවුල් කිරීමේ ආඥා රජයේ ගැසට් පත්‍රයේ පල කිරීමට ඇති | |

| | |
|---|---|
| | 16 |
| | ------- |
| **එකතුව** | 70 |
| | ==== |

**(ආ) සැලසුම් කිරීම**

**-----------------**

**(i) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සංයුක්ත සැලැස්මට අනුකූල නොවීම**

**------------------------------------------------------------------**

පහත සඳහන් අවස්ථාවලදී පිළියෙල කර තිබුණු වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සංයුක්ත සැළැස්මට අනුකූල වී නොතිබුණි.

- බිම් සවිය වැඩසටහන සඳහා 2013 වර්ෂයේදී භාණ්ඩාගාරය විසින් නියම කළ ඉලක්කය බිම්කැබලි 500,000 ක් සඳහා හිමිකම් සහතික නිකුත් කිරීම වුවද දෙපාර්තමේන්තුව ඉඩම් කැබලි 97,000 ක් පමණක් බිම්සවිය සහතික නිකුත් කිරීමට ඉලක්කකර තිබුණි.

- පහත දැක්වෙන පරිදි බිම් සවිය වැඩසටහනේ 2013 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්මේ සඳහන් ඉලක්කගත අරමුණු ඉෂ්ඨ කරගැනීම දුර්වල තත්වයක පවතින බව නිරීක්ෂණය විය.

| **විස්තරය** | **ක්‍රියාකාරී සැලැස්ම අනුව ඉලක්කගත අරමුණ** | **කාර්ය සාධන වාර්තාව අනුව 2013 වර්ෂයේ ප්‍රගතිය** |
|---|---|---|

| | (සමුච්චිත ඉඩම් කැබලි) | (ඉඩම් කැබලි) |
|---|---|---|
| ක්ෂේත්‍ර විමර්ශනය | 224,280 | දක්වා නොමැත |
| ඉඩම් ලියාපදිංචි පරීක්ෂණ | 168,208 | දක්වා නොමැත |
| ඉඩම් නිරවුල් කිරීමේ කොමසාරිස් විසින් අනුමත කැබලි සංඛ්‍යාව | 134,568 | 71,315 |
| ගැසට් කල කැබලි සංඛ්‍යාව | 134,568 | 58,690 |
| ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත යවන ලද කැබලි සංඛ්‍යාව | 67,284 | 52,542 |

- දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාකාරී සැලැස්මට අනුව 14 වන වගන්තිය යටතේ ගැසට් කිරීම සඳහා අනුමත කරන ලද කැබලි සංඛ්‍යාව 134,568 ක් වුවද කැබලි 58, 690 ක් එනම් සියයට 44 ක් පමණක් ගැසට් කර තිබුණි.

- මිනින්දෝරු දෙපාර්තමේන්තුව විසින් මැනුම් කළ කැබලි 104,173 ක් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණද ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් වෙත යැවීමට කටයුතු කර තිබුණේ ඉන් කැබලි 52, 542 ක් එනම් සියයට 50 ක් පමණි.

## 3.7 අවිධිමත් ගනුදෙනු

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

### (අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම.

වාහනයක් රු. 111,680 ක වියදමක් දරා අළුත්වැඩියා කරගෙන තිබුණු අතර ලංසු විවෘත කිරීමට පෙර අළුත්වැඩියාවන් සිදුකර ගෙන තිබුණු බව නිරීක්ෂණය විය. ඒ අනුව ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.6 ඡේදය, 6.3.3 ඡේදයේ පරිදි කටයුතු කර නොතිබූ බවත් විධිමත් අනුමැතියකින් තොරව වාහනය අළුත්වැඩියා කරගෙන තිබූ බවත්

නිරීක්ෂණය විය. තවද සිදුකරන ලද අළුත්වැඩියාවන් සඳහා අදාල ආයතනයෙන් වගකීම් සහතිකයක් ද නිකුත්කර නොතිබුණි.

**3.8 පාඩු හා හානි**

--------------

2012 වර්ෂයේ විසර්ජන ගිණුමේ පාඩු හා අත්හැරීම් යටතේ අනතුරට ලක්වූ අවස්ථාවේ අලාභහානිය රු.1,200,975 ක් ලෙස දක්වා තිබුණු වාහනයක් 2013 වර්ෂයේදී දෙපාර්තමේන්තු ප්‍රතිපාදන වලින් රු. 571,006 ක් වැයකර අළුත්වැඩියා කර තිබුණි. මෙම වාහනය සඳහා රක්ෂණ හිමිකම් ලබාදීම ප්‍රතික්ෂේප කර තිබුණු අතර පාඩුවට වගකිවයුතු අයගෙන් අයකර ගැනීමක්ද කර නොතිබුණි. නමුත් මුලදී හඳුනාගත් අලාභහානි වටිනාකම වෙනුවට තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට ඇති වටිනාකම රු. 571,006 ක් ලෙස සමාලෝචිත වර්ෂයේ විසර්ජන ගිණුමේ දක්වා තිබුණි. තවද, 2012 දෙසැම්බර් 31 දිනට අයකර ගැනීමට හෝ කපාහැරීමට තිබුණු අලාභ ලෙස දක්වා තිබුණු රු. 22,250 ක් සම්බන්ධයෙන් සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වා කටයුතු කර නොතිබුණු බව නිරීක්ෂණය විය.

**3.9 අනාර්ථික ගනුදෙනු**

---------------------

2014 පෙබරවාරි 03 දින සිට පුත්තලම කාර්යාලය වෙත අනුයුක්ත කර ඇති අංක 62 - 4097 දරන ලැන්ඩ්රෝවර් ජීප් රථය 2012 සහ 2013 යන වර්ෂ වලදී පිළිවෙලින් රු. 579,623 ක් හා රු. 293,300 ක් දරා තිබූ අතර 2014 වර්ෂයේ මාර්තු මාසයේදී රු. 148,000 ක් වැයකර නැවත අළුත්වැඩියා කර තිබුණි. ඒ අනුව ජීප් රථයේ අළුත්වැඩියා කටයුතු නිසි තාක්ෂණික ඇගයීමකින් යුතුව කර ඇති බව නිරීක්ෂණය නොවේ.

**3.10 මානව සම්පත් කළමනාකරණය**

----------------------------------

**(අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 103 | 15 | 88 | - |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ii) | තෘතියික මට්ටම | 05 | 02 | 03 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1296 | 387 | 909 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 320 | 156 | 164 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 26 | - | 26 |
| | **එකතුව** | 1724 | 586 | 1164 | 26 |

දෙපාර්තමේන්තුවේ අනුමත සේවක සංඛ්‍යාවෙන් පුරප්පාඩු සේවක සංඛ්‍යාව සියයට 68 ක් වූ අතර එම පුරප්පාඩු පිරවීමට කටයුතුකර නොතිබුණෙන් කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 26 දෙනෙකු බඳවා ගැනීමට සිදුව තිබුණි.

**4. ශීර්ෂය -288- මිනින්දෝරු දෙපාර්තමේන්තුව**

**4.1 විගණන විෂය පථය**

මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම හා ආදායම් ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් 05 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සෙයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**4.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ හා ගණන් දිමේ නිලධාරීගේ වගකීම**

**------------------------------------------------------------------------------------------------------**

**----**

විසර්ජන ගිණුම, අදායම් ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරී හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**4.3 විගණන නිරීක්ෂණය**

**-----------------------**

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුම, ආදායම් ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන මෙහි (අ) සිට (ඉ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 4.4 සිට 4.11 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

**----------------------------------------------**

දෙපාර්තමේන්තුව විසින් පාඩු හා හානි ලේඛනය විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බැව් නියැදි පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

**(ආ) අයවැය විචලනය**

**-------------------**

වැය විෂයයන් 15 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාළ ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 10 සිට සියයට 57 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

**------------------------**

2013 වර්ෂයේ මැනුම් ගාස්තු ලෙස තැන්පත් ගිණුමේ ඇති මුදලින් රු.90,572,220 ක මුදලක් දිරි දිමනා ලෙස ගෙවීම් කර තිබුණු අතර ගමන් වියදම්, ඉන්ධන හා වෙනත්

වියදම් සඳහා ද 2013 වර්ෂයේ වාර්ෂික අයවැය මගින් ප්‍රතිපාදන වෙන්කර තිබියදී එම ප්‍රතිපාදන වලට අමතරව පොදු තැන්පත් ගිණුමෙන් රු.18,655,614 ක් ගමන් වියදම්, ඉන්ධන හා වෙනත් වියදම් සඳහා 2013 වර්ෂයේදි වැයකර තිබුණි.

**(ඇ) ආදායම් ගිණුම**

**---------------**

**ඇස්තමේන්තුගත හා තත්‍ය ආදායම**

**----------------------------------**

දෙපාර්තමේන්තුව විසින් 2013 වර්ෂයේ ආදායම් සංකේත අංක 20.03.02.04 සඳහා ඇස්තමේන්තු කර තිබුණු ආදායම රු.මිලියන 122 ක් වූ අතර වර්ෂයේදි රු.මිලියන 133.8 ක ආදායමක් රැස් කර තිබුණි.

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(i) 2010, 2011, සහ 2012 යන වර්ෂ වල පිළිවෙලින් සියයට 11 සියයට 14 සහ සියයට 23 ක් වශයෙන් ආදායමේ වර්ධනයක් පෙන්නුම් කළද සමාලෝචිත වර්ෂයේ ආදායමේ වර්ධනය ඉතා අඩු මට්ටමක එනම් සියයට 1 ක් වී තිබුණි.

(ii) ඇතැම් මැනුම් සඳහා ගාස්තුවලින් සියයට 50 ක් පමණක් අය කර තිබීමත් එම මුදලද දිරි දීමනා සහ අනෙකුත් වියදම් ගෙවීම සඳහා යොදා ගැනිමත්, සමහර විශේෂ ව්‍යාපෘති මැනුම් ගාස්තු තුලින් රාජ්‍ය ආදායමට කිසිදු මුදලක් බැර නොකර සම්පූර්ණ ගාස්තු ප්‍රමාණයට දිරි දීමනා ගෙවිමට යොදා තිබීමත් ආදායම අඩුවීමට බලපෑ ප්‍රධාන හේතු බව නිරීක්ෂණය විය. මෙලෙස නුවරඑළිය දිස්ත්‍රික්කයේ චීන සංවර්ධන බැංකු ආධාර ව්‍යාපෘතියක් යටතේ ලැබී තිබුණු රු.2,979,469 ක මුදලක් සම්පුර්ණයෙන්ම දිරි දිමනා ගෙවිම සඳහා යොදා ගෙන තිබුණි.

(iii) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට වූ හිඟ ආදායම රු.25,160 ක් විය.

**(ඉ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය**

**------------------------------------------------------------------**

විෂය අංක 28801 දරන අත්තිකාරම් ගිණුම් පිළිබඳ 2013 දෙසැම්බර් 31 දිනට සැසඳුම් ප්‍රකාශය ප්‍රකාරව එදිනට අයවිම් හිඟහිට තිබුණු ශේෂ වල එකතුව රු.1,529,766 ක් වූ

අතර එම හිඟහිටි ශේෂ අයකර ගැනීමේ පසුවිපරම් කටයුතු දුර්වල තත්ත්වයක පැවතුණි.

## 4.4 වත්කම් කළමනාකරණය

--------------------------

### (අ) වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම

------------------------------------------------------------

පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) වනසම්පත් හා පාරිසරික අමාත්‍යාංශය විසින් වාහන 4 ක් දෙපාර්තමේන්තුව වෙත ලබා දී තිබුණද ඒවා ලබාදුන් දිනයන් පිළිබඳ විස්තර විගණනයට ඉදිරිපත් නොවූ අතර එම වාහන නිසි ලෙස පවරා ගෙන නොතිබූ බවද නිරීක්ෂණය විය.

(ii) බිම්සවිය ප්‍රතිපාදන මගින් රු. මිලියන 82 ක් වැයකර ඉදිකරන ලද දෙපාර්තමේන්තුවේ ගොඩනැඟිලි සහ මිලදී ගන්නා ලද මැනුම් උපකරණ ඇතුළු විවිධ ප්‍රාග්ධන වත්කම් ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයෙන් පවරාගැනීමකින් තොරව පරිහරණය කරමින් තිබුණි.

### (ආ) බේරුම් නොකළ බැරකම්

--------------------------

(i) වැය විෂයයන් 13 කට අදාලව, ඉතිරිය ඉක්මවා රු. 17,345,762 ක බැරකම් සඳහා බැඳී තිබුණි.

(ii) අවස්ථා 197 කට අදාල එකතුව රු. 14,819,738 ක බැරකම් සමාලෝචිත වර්ෂයේ විසර්ජන ගිණුමේ ඩී.ජී.එස්.ඒ.8 ආකෘතියේ දක්වා නොතිබුණු අතර දියතලාව මැනුම් පුහුණු ආයතනයේ අවස්ථා 62 කට අදාල රු. 983,868 ක් උතුරු මැද පළාතේ කිසිදු බැරකමක් එම ආකෘතියට ඇතුළත් කර නොතිබුණි.

## 4.5 අනුකූල නොවීම්

--------------------

### (අ) නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

------------------------------------------------

නියැදි විගණන පරීක්ෂණ වලදි නිරීක්ෂණය වූ නීති, රීති, හා රෙගුලාසිවල විධිවිධාන වලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නීති, රීති, රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|
| **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදි ජනරජයේ මුදල් රෙගුලාසි** | රු. | |
| (i) මුදල් රෙගුලාසි 105(5) | 1,159,141 | මහනුවර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයීය නව ගොඩනැගිල්ල ඉදිකිරීමේදී රක්ෂණාවරණයක් ලබාගෙන නොතිබීම හේතුවෙන් එම ගොඩනැගිල්ල අසල වූ අධාරක බැම්ම කඩා වැටීම නිසා සිදුවූ අලාභය අවම කර ගැනීමට නොහැකි වී තිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 208(ඇ) | | ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වරයාගේ පූර්ව අනුමැතියකින් තොරව මහනුවර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ නව දෙමහල් ගොඩනැගිල්ල අසල පිහිටි ආධාර බැම්ම ඉදිකිරීම සඳහා බිම්සවිය ප්‍රතිපාදන යොදවා ගෙන තිබුණි. |

## 4.6 කාර්යසාධනය

2013 වාර්ෂික අයවැය ඇස්තමේන්තු ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

### 4.6.1 සැලැසුම් කිරීම

**(අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකිරීම**

---------------------------------------------------------------

පහත සඳහන් අවස්ථාවලදී දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව ක්‍රියා නොකර තිබුණු බව නිරීක්ෂණය විය.

**(ආ) හිමිකම් ලියාපදිංචි කිරීමේ මැනුම් අංශය**

---------------------------------------

2013 වර්ෂයේ විසර්ජන පනතට අනුව බිම්සවිය හිමිකම් සහතිකපත් 500,000 ක් නිකුත් කිරීම සඳහා කටයුතු කළයුතුව තිබුණද දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලැස්මට අනුව බිම් කැබලි 147,000 ක් මැන කඩඉම් සිතියම් සකස් කිරීමට අරමුණු කර තිබුණු අතර කාර්ය සාධන වාර්තාව අනුව වැඩ අවසන් කර හිමිකම් නිරවුල් කිරීමේ කොමසාරිස් වෙත යවා තිබුණේ බිම් කැබලි 110,630 ක් පමණි.

(i) බිම්සවිය 2010 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වැඩසටහනේ ඉලක්කය හා දෙපාර්තමේන්තු ප්‍රගතිය දැක්වෙන සටහනක් පහත දැක්වේ.

| **වර්ෂය** | **ඉලක්කය(හිමිකම් සහතිකපත්) විසර්ජන පනතට අනුව** | **මිනින්දෝරු දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය** |
|---|---|---|
| 2010 | 100,000 | 168,444 |
| 2011 | 150,000 | 158,538 |
| 2012 | 200,000 | 124,727 |
| 2013 | 500,000 | 110,630 |

2012 සහ 2013 වර්ෂ වලදී ඉලක්ක කරා ලගා වී නොතිබුණු බව නිරීක්ෂණය විය.

**(ඇ) විභාග අංශයේ ප්‍රගතිය**

----------------------

(i) 2013 වර්ෂයේ දියතලාව මැනුම් පුහුණු කිරීමේ ආයතනය මඟින් විභාග 22 ක් පැවැත්වීමට ක්‍රියාකාරී සැලැස්මේ දක්වා තිබුණ ද සත්‍ය වශයෙන්ම 2013 වර්ෂයේ පැවැත්වීමට කටයුතු කර තිබුණේ විභාග 10 ක් පමණි.

(ii) සිතියම් තාක්ෂණ නිලධාරින් සඳහා වන විභාගය 2013 සැප්තැම්බර් 28 සහ 29 යන දෙදින පැවැත්විමට නියමිතව තිබූ අතර ඒ සඳහා කිසිදු අපේක්ෂකයෙකු නොපැමිණියද ඒ සඳහා රු. 31,680 ක මුදලක් වැයකර තිබුණි.

## 4.7 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

--------------------------------

**දෙපාර්තමේන්තුවේ නිලධාරින් / සේවකයින් සඳහා වන දිරිදීමනා ක්‍රමය**

--------------------------------------------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් සිදුකර තිබුණු සමහර ගනුදෙනු මතභේදාත්මක ස්වරූපයේ ඒවා විය. නියැදි පරීක්ෂණ වලදී අනාවරණය වූ එවැනි ගනුදෙනු කිහිපයක් පිළිබඳ විස්තර පහත දැක්වේ.

(අ) දෙපාර්තමේන්තුවේ නිලධාරීන්/ සේවකයින් සඳහා දිරිදීමනා ක්‍රමයක් ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාවේ නිර්දේශ අනුව ආයතන අධ්‍යක්ෂ ජනරාල් විසින් ඔහුගේ අංක ආ/8/3/706/272/27 හා 2008 නොවැම්බර් 03 සහ 2009 ජනවාරි 05 දිනැති ලිපි මගින් අනුමත කර තිබුණු නමුත් එහි විධිවිධානවලට අනුකූල නොවන ලෙස දිරිදීමනා ගෙවමින් තිබුණු බවත් ඒ සඳහා නිකුත් කළ 2009 ජනවාරි 09 දිනැති අංක 01/2009 අභ්‍යනතර චක්‍රලේඛය අවස්ථා තුනකදි සංශෝධනය කර තිබුණද ඒ සඳහා ආයතන අධ්‍යක්ෂවරයාගේ අනුමැතිය ලබාගෙන නොතිබුණු බවත් නිරීක්ෂණය විය. ආයතන සංග්‍රහයේ XI පරිච්ඡේදයේ 2.2.4 ඡේදයට අනුව දෙපාර්තමේන්තුව විසින් ගාස්තුවක් අයකොට එම සේවා ඉටුකර දීමේදී, එම සම්පූර්ණ ආදායම ඒකාබද්ධ අරමුදලට බැරකළ යුතු වුවද විශේෂ ව්‍යාපෘති මැනුම් ආදායමින් 2012 වර්ෂයේදි රු. 20,986,598 ක් හා 2013 වර්ෂයේදි රු. 19,554,907 ක මුදලක් ඒකාබද්ධ අරමුදලට බැර නොකර දිරිදීමනා වශයෙන් නිලධාරීන් වෙත ගෙවා තිබුණි.

(ආ) මෙම දිරිදීමනා මුදල අනුමත කර ගැනීමේදි දෙපාර්තමේන්තුවේ නිලධාරීන් වෙත ගෙවනු ලබන අධීක්ෂණ ගාස්තු, බිම් සවිය දිරිදීමනා, ජපන් ජාත්‍යන්තර සහයෝගීතා ආයතනය (JICA ) ව්‍යාපෘතියේ රාජකාරී ඉටුකරන නිලධාරීන්ට මූලික වැටුපින් 10 % ක දීමනා, කමිටු දීමනා, උපකරණ බලා ගැනිමේ දීමනා, ඉන්ධන හා ගමන්වියදම්, නිවාස කුලී

යනාදිය සැලකිල්ලට ගෙන නොතිබුණු අතර දෙපාර්තමේන්තු නිලධාරීන් 2013 වර්ෂයේදී සිය මූලික වැටුපට සාපෙක්ෂව ඉපයීම් කර ඇති ආකාරය පහත පරිදි විය.

| වැටුපට සාපෙක්ෂව වාර්ෂික ඉපයීම් ප්‍රතිශතය | නිලධාරීන් සංඛ්‍යාව |
|---|---|
| **100-200** | **33** |
| **200-300** | **23** |
| **300-400** | **11** |
| **400-500** | **05** |
| **500-600** | **01** |

දිරිදීමනා ගෙවීමේදී මිනින්දෝරුවරයෙකු මාසිකව ඉටුකළ යුතු අවම වැඩ ප්‍රමාණය කැබලි 30 ක් ලෙස (Monthly Norms) තිරණය කර තිබුණ ද, මසකට දිරිදීමනා සහ අධීක්ෂණ ගාස්තු ගෙවීමට අදාල කරගත හැකි උපරිම කැබලි සංඛ්‍යාවක් පිළිබඳ සීමාවකින් තොරව 2012 සහ 2013 වර්ෂවල දිරිදීමනා ගෙවා තිබුණි.

(ඈ) දිරිදීමනා ගෙවීම සඳහා අයවැය ඇස්තමේන්තුවෙන් ප්‍රතිපාදන වෙන් කරවාගෙන ඒ අනුව කටයුතු කරන බව සර්වේයර් ජනරාල්ගේ 2011 ජූලි 06 දිනැති ජ/ගිණුම්/පොතැ/02/11/315 දරන ලිපියෙන් දන්වා තිබුණද තැන්පත් ගිණුම උපයෝගී කරගෙන දිරිදීමනා ගෙවීම සිදු කරනු ලබන බව නිරීක්ෂණය විය. ආයතන අධ්‍යක්ෂ ජනරාල් වරයාගේ අංක EST/8/ALLOW/03/272/28 දරන 2013 ජූලි 05 දිනැති ලිපියට අනුව පවත්නා දිරිදීමනා ක්‍රමවේදය නැවත සමාලෝචනය කර ජාතික වැටුප් හා සේවක සංඛ්‍යා කොමිෂන් සභාව වෙත දන්වන ලෙස දක්වා තිබුණ ද 2014 නොවැම්බර් 20 දක්වාම මේ සම්බන්ධයෙන් කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

## 4.8 අවිධිමත් ගනුදෙනු

**(අ) ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටියෙන් බැහැරවීම**

දෙපාර්තමේන්තුව විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවින් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

**(i) මහනුවර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ නව දෙමහල් ගොඩනැගිල්ල අසල ආධාරක බැම්ම ඉදිකිරීම - රු. 1,159,141**

**----------------------------------------------------------------------------------------**

මහනුවර දිස්ත්‍රික් මිනින්දෝරු කාර්යාලයේ නව දෙමහල් ගොඩනැගිල්ල ඉදිකිරීමේ කටයුතු සිදුකළ ආයතනයටම මායිම් තාප්පය ඉදිකිරීමේ කටයුතු ද විවෘත මිල ගණන් කැඳවීමකින් තොරව පවරා තිබුණු බව නිරීක්ෂණය විය. තවද රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.1(ආ) iv ඡේදයේ දැක්වෙන පරිදි කොන්ත්‍රාත්තුව අධීක්ෂණය කිරීමේ සහ පරිපාලනය කිරීමේ කාර්යය සඳහා ඉංජිනේරුවරයෙකු හෝ උපදේශකයකු සේවයේ යෙදවීමට ප්‍රසම්පාදන අස්ථිත්වය අපේක්ෂා කරන්නේ නම් ඉංජිනේරුවරයාගේ හෝ උපදේශකවරයාගේ අධිකාරී බලය හා කර්තව්‍යයන් කොන්ත්‍රාත් ආයතනය සමග ඇතිකරගත් ගිවිසුම් කෙටුම්පතේ පැහැදිළිව සඳහන් විය යුතු වුවද ඒ අනුව කටයුතුකර නොතිබුණි.

**(ii) මිහිකත මැඳුර පරිශ්‍රයේ මිනින්දෝරු දෙපාර්තමේන්තුව මඟින් සිතියම් විකිණීමේ මධ්‍යස්ථානයක් ඉදිකිරිම හා එය පවත්වා ගෙන යාම.**

**----------------------------------------------------------------------------------------**

දෙපාර්තමේන්තුවෙහි ගොඩනැගිලි ඉදිකිරිම සඳහා සලසා තිබුණු ප්‍රතිපාදන මුදලින් රු. 400,000 ක මුදලක් විධිමත් අනුමැතියකින් තොරව ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයේ විකිණීමේ කවුළුව ඉදිකිරිමට වැයකර තිබුණි. තවද සිතියම් විකිණීමෙන් පසු මුදල් ගෙවීමේ පදනම මත 2013 ජූලි 30 වන විට රු.51,632 වටිනා සිතියම් තොගයක් අමාත්‍යාංශය වෙත ලබා දී තිබුණද ඒ සම්බන්ධයෙන් දෙපාර්ශවය අතර කිසිදු ලිඛිත ගිවිසුමකට එළඹ නොතිබුණු බවත් ආදායම ඉතා අඩු බැවින් ප්‍රමාණවත් ආදායමක් උපයාගත හැකිද යන්න පිළිබඳ ශක්‍යතා අධ්‍යනයකින් තොරව මෙම කවුළුව ඉදිකර තිබුණු බවත් නිරීක්ෂණය විය.

**4.9 පාඩු හා හානි**

--------------

නියැදි විගණන පරීක්ෂණ වලදී අනාවරණය වූ පාඩු හා හානි පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

(අ) 1984 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා කාලය තුල අවස්ථා 15 කදී සිදුව තිබුණු අලාභහානි වෙනුවෙන් රු.1,865,873 ක මුදලක් සමාලෝචිත වර්ෂයේදී කපා හැර තිබුණි.

(ආ) 2012 දෙසැම්බර් 31 දිනට තවදුරටත් අයවීමට හෝ කපාහැරීමට තිබුණු අවස්ථා 10 කට අදාල රු.258,589 ක් සහ 2013 වර්ෂයේදී අවස්ථා 06 කදී සිදුව තිබුණු රු.142,000 ක් වූ වාහන අනතුරු වලට අදාල අලාභහානි ද ශේෂ ප්‍රවාහන අංශ උපලේඛනය අනුව 2013 වර්ෂයට පෙර සිදු වූ අනතුරු අවස්ථා 16 කට අදාළ රු.1,420,908 ක අලාභහානිද 2013 වර්ෂයේ විසර්ජන ගිණුමේ ඩී.ජී.එස්.ඒ. 7(i) ආකෘතියෙන් අත්හැරී තිබුණි.

(ඇ) තවදුරටත් අයකර ගැනීමට හෝ කපාහැරීමට තිබෙන බවට දක්වා තිබුණු රජයේ භාණ්ඩ සඳහා වූ අලාභහානි සහ වාහන අනතුරු වලින් වූ අලාභ පිළිබඳ කාලවිශ්ලේෂණය පහත පරිදි විය.

| | මෙහෙයුම් වැඩසටහන | | සංවර්ධන වැඩසටහන | |
|---|---|---|---|---|
| කාල පරාසය | අවස්ථා ගණන | අලාභයේ වටිනාකම<br>රු. | අවස්ථා ගණන | අලාභයේ වටිනාකම<br>රු. |
| ---------------- | -------------- | ------------- | ---------------- | ----------- |
| අවු. 1 ට අඩු | 07 | 227,306 | 11 | 893,189 |
| අවු. 1 – 5 අතර | 10 | 803,652 | 32 | 2,993,527 |
| අවු. 6 – 10 අතර | - | - | 07 | 927,718 |
| අවු. 11 – 15 අතර | 03 | 428,133 | 05 | 556,305 |
| අවු. 16 – 20 අතර | - | - | 02 | 118,450 |
| අවු. 20 ට වැඩි | 06 | 1,017,291 | - | - |

| | |
|---|---|
| -------------- | ------------ |
| 2,476,382 | 5,489,189 |
| ======== | ======== |

(ඇ) 2013 පෙබරවාරි 23 දින අනතුරකට භාජනය වී තිබුණු වාහනයක් වෙනුවෙන් මුදල් රෙගුලාසි 104(4) යටතේ වූ අලාභයන් පිළිබඳ අවසාන වාර්තාවේ අලාභය රු.1,298,792.86 ක් ලෙස වාර්තා කර තිබුණද විසර්ජන ගිණුමෙහි අලාභය රු.479,720 ක් ලෙස දක්වා තිබුණි.

(ඉ) වාහන අනතුරු හා රජයේ භාණ්ඩ වලට හානි සිදුවීම් අවස්ථා 06 කට අදාල රු.498,291 ක් වගකිවයුත්තන්ගෙන් අයකර ගැනිමට නිර්දේශ කර තිබුණද ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ඊ) සුදුසුකම් නොලත් සේවකයන්ට වාහන භාවිතා කිරීමට ඉඩ ලබාදීම, රියදුරු විසින් නොසැලකිලිමත්ව වාහන ධාවනය කිරීම, අනතුර පිළිබඳ එම අවස්ථාවේම පොලීසියට දැනුම් නොදීම, වගකිවයුතු පාර්ශවයන්ගෙන් අලාභහානිය අයකර ගැනීමට පියවර ගෙන නොතිබුණු අවස්ථා 07 ක් 2013 වර්ෂයේ වාහන අනතුරු සම්බන්ධයෙන් සිදුකළ නියැදි පරික්ෂාවේදී අනාවරණය විය.

(උ) රජයේ වාහන රක්ෂණය කිරීම තුලින් සිදුවන අලාභහානිය අවම කරගත හැකි වෙතත්, වාහන අනතුරට අදාල වගකිවයුතු පිටස්තර පාර්ශවයන්ගෙන් අලාභය පියවා ගැනීමට

කටයුතු කර නොතිබුණු අවස්ථා 07 ක් විගණනයට නිරීක්ෂණය වූ අතර මේ හේතුවෙන් රක්ෂණ හිමිකම් නොපෑමෙන් ලැබෙන ප්‍රසාද දීමනාව (Bonus Claim) ආයතනයට අහිමි වී තිබුණි.

**4.10 කළමනාකරණ දුර්වලතා**

**------------------------**

(i) දෙපාර්තමේන්තුව මගින් ඇඟිලි සලකුණු යන්ත්‍රයක් යොදවා ආරක්ෂක නිලධාරීන්ගේ පැමිණිම සහ පිටවීම සටහන් කිරීමට කටයුතු කර තිබුණද පැමිණීමේ වාර්තාවන්හි පැමිණිම පිටවීම පැහැදිලිව පවත්වාගෙන නොතිබුණ අතර ව්‍යාජ අත්සන් යොදා තිබෙනු ද සනාථ වූ අතර වගකිවයුතු නිලධාරියකුගෙන් අධීක්ෂණය වී නොතිබුණි.

**4.11 මානව සම්පත් කළමනාකරණය**

**--------------------------------**

**(අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

**----------------------------------------------------**

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව | අතිරික්ත සංඛ්‍යාව |
|---|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 104 | 95 | 09 | - |
| (ii) | තෘතියික මට්ටම | 1098 | 778 | 320 | - |
| (iii) | ද්විතියික මට්ටම | 1175 | 804 | 371 | - |
| (iv) | ප්‍රාථමික මට්ටම | 4871 | 3226 | 1645 | - |
| (v) | වෙනත් (අනියම් / තාවකාලික / කොන්ත්‍රාත් පදනම) | - | 01 | - | 01 |
| | එකතුව | 7248 | 4904 | 2345 | 01 |

දෙපාර්තමේන්තුවේ මුළු කාර්ය මණ්ඩලයෙන් සියයට 32 ක් පුරප්පාඩුව පැවතුනු අතර පරිපාලන නිලධාරී තනතුර 2012 වර්ෂයේ සිට 2014 නොවැම්බර් මාසය දක්වාත් කොන්ත්‍රාත් පදනම මත පවත්වාගෙන තිබුණි.

## 5 ශීර්ෂය 327 - ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව

-----------------------------------------------------------------------------------------------------------

### 5.1 විගණන විෂය පථය

--------------------

ඉඩම් පරිහරණ හා ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන, පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2014 දෙසැම්බර් 25 දින දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සෙයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වි ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

### 5.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන් දිමේ නිලධාරිගේ හා ගණන් දිමේ නිලධාරිගේ වගකීම

----------------------------------------------------------------------------------------------------
----

විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148, 149, 150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වාගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දිමේ නිලධාරි හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලැසුම් කිරීම, ක්‍රියාත්මක කිරිම සහ පවත්වා ගෙනයාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

### 5.3 විගණන නිරීක්ෂණය

------------------------

2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය වාර්තා හා පොත් අනුව ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුවේ විසර්ජන ගිණුමහා සැසඳුම් ප්‍රකාශන (අ) සිට (ආ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 5.4 සිට 5.9 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) අයවැය විචලනය**

**------------------**

වැය විෂයයන් 04 ක් සඳහා අධි ප්‍රතිපාදන සළසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 12 සිට සියයට 62 දක්වා පරාසයක ප්‍රමාණයක් ගෙන තිබුණි.

**(ආ) පොදු තැන්පත් ගිණුම්**

**-----------------------**

උතුරු වසන්තය හා නැගෙනහිර නවෝදය වැඩසටහන් සඳහා ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයෙන් ලැබී පොදු තැන්පත් ගිණුමෙහි ඇතුළත්කර තිබුණු වර්ෂ 02 ඉක්මවූ රු. 98,057කින් සමාලෝචිත වර්ෂයේදී වාහන අළුත්වැඩියා සඳහා රු. 48,797ක්ද , ටෝනර් සහ කාඩ්රිජ් මිලදීගැනීම සඳහා රු. 49,260 ක්ද වැයකර තිබුණු අතර අදාල වැය විෂයයන්හි ප්‍රතිපාදන ඉතිරිව නොතිබුණු බවද නිරීක්ෂණය විය.

**5.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය**

**-------------------------------------**

**5.4.1 වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම**

**-----------------------------------**

2006 මාර්තු 24 දිනැති අංක 128 දරන ජාතික අයවැය චක්‍රලේඛය ප්‍රකාරව වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම2013 දෙසැම්බර් 31 දින වන විටත් පිළියෙල කර නොතිබුණි.

**5.4.2 අභ්‍යන්තර විගණනය**

------------------------

දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර විගණන ඒකකයක් ක්‍රියාත්මකව නොතිබුණු අතර අමාත්‍යාංශ අභ්‍යන්තර විගණන අංශය විසින් විගණනයන් සිදුකර තිබුණද එය ප්‍රමාණවත් නොවීය.

**5.5 වත්කම් කළමනාකරණය**

**-------------------------------**

(අ) **නිෂ්ක්‍රීය හා ඌන උපයෝජිත වත්කම්**

---

පරිගණක හා උපාංග 132 ක් කාර්යාල උපකරණ 193 ක් හා ලී බඩු හා සවිකිරීම් 94 ක නිෂ්ක්‍රීයව හෝ ඌන උපයෝජිතව පැවති බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

(ආ) **වාර්ෂික භාණ්ඩ සමීක්ෂණ පැවැත්වීම**

---

(i) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ 2010 දෙසැම්බර් 17 දිනැති අංක පීඑෆ්/සමීක්ෂණ මණ්ඩල/01 දරන ලිපිය මගින් සංශෝධිත 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාර 2013 වාර්ෂික භාණ්ඩ සමීක්ෂණය සිදුකර 2014 මාර්තු 31 දිනට ප්‍රථම එම වාර්තා විගණකාධිපති වෙත ඉදිරිපත් කළයුතු වුවත්, දෙපාර්තමේන්තුව 2014 නොවැම්බර් 28 දින වන විටත් දිස්ත්‍රික් කාර්යාල 10 කට අදාල වාර්තා විගණනය වෙත ඉදිරිපත් කර නොතිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේදී රු. 6,026,451 ක් වටිනා වත්කම් මිලදී ගෙන තිබුණු අතර එහි නිවැරදිතාවය තහවුරු කර ගැනීම සඳහා යාවත්කාලීන කරන ලද ස්ථාවර වත්කම් ලේඛනය විගණනයට ඉදිරිපත් නොකෙරුණි. 2012 වර්ෂයේදී ද මෙම තත්ත්වය නිරීක්ෂණය විය.

(ඇ) **වෙනත් ආයතන සතු වත්කම් අවිධිමත්ව පරිහරණය කිරීම**

---

ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය වාහන 25 ක් දෙපාර්තමේන්තුව විසින් විධිමත් පරිදි පවරා ගැනීමකින් තොරව භාවිතයට ගෙන තිබුණි.

(ඈ) **බේරුම් නොකළ බැරකම්**

---

දෙපාර්තමේන්තුව විසින් 2013 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.308,379 ක් වූ අතර, එම බැරකම් වර්ෂයකට වඩා අඩු කාලයකට අයත්විය. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

i. සමාලෝචිත වර්ෂය අවසාන වන විට අවස්ථා 25 කදී එකතුව රු. 974,877 ක බැරකම්වලට බැඳී තිබුණු අතර විසර්ජන ගිණුම සමග ඉදිරිපත්ව තිබුණු ඩී.ජී.එස්.ඒ. 8 ආකෘතියේ ඒ පිළිබඳ සටහන් කර නොතිබුණි.

ii. වැය විෂයන් 05 කට අදාලව රු. 682,910 ක් ඉතිරිවීම් ඉක්මවා බැරකම් වලට බැඳී තිබුණු බැවින් ප්‍රතිපාදන ඉක්මවා වියදම් දරා ඇති බව නිරීක්ෂණය විය.

## 5.6 අනුකූල නොවීම්

**නීති, රීති හා රෙගුලාසි යනාදියට අනුකූල නොවීම**

2009 අප්‍රේල් 16 දිනැති අංක 09/2009 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය හා 2009 ජූනි 17 දිනැති අංක 09/2009 (I) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සියළුම රාජ්‍ය සේවකයන් පැමිණීම හා පිටවීම සනාථ කිරීම සඳහා ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතා කල යුතු වුවත් දෙපාර්තමේන්තුවේ 68 ක කාර්යමණ්ඩලයක් සිටියද 2014 නොවැම්බර් 20 දක්වාම ඇඟිලි සලකුණු යන්ත්‍ර භාවිතාකර නොතිබුණි.

## 5.7 ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ දුර්වලතා

**(අ) ව්‍යාපෘති ඉටුකිරීමේ ප්‍රමාදයන්**

(i) උගත් පාඩම් හා ප්‍රතිසංධාන කොමිෂමේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ වැඩසටහන සඳහා දෙපාර්තමේන්තුවට රු. මිලියන 15 ක ප්‍රතිපාදන ලබා දී තිබුණු නමුත් එයින් රු. 4,125,32ක් පමණක් උපයෝජනය කර තිබුණු අතර ප්‍රාදේශීය මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් 79 ක් පැවැත්වීමට සැලසුම් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසානයට වැඩසටහන් 62 ක් පමණක් පවත්වා තිබුණි.

(ii) දිස්ත්‍රික් 08 ක ක්ෂේත්‍ර කටයුතු සඳහා 1: 10,000 සිතියම් යාවත්කාලීන කිරීම සඳහා දෙපාර්තමේන්තුව ආවරණය කළ යුතු සිතියම් සංඛ්‍යාව 759 ක් වුවද දිස්ත්‍රික්ක 02 ක සිතියම් 33ක් පමණක් නිම කර තිබුණි.

**5.8** **කාර්යසාධනය**

-------------------

2013 ක්‍රියාකාරී සැලැස්ම අනුව දෙපාර්තමේන්තුවේ ප්‍රගතිය පිළිබඳ නිරීක්ෂණ පහත දැක්වේ.

**ප්‍රමාණවත් ලෙස ඉටුනොකළ ප්‍රධාන කාර්යයන්**

-----------------------------------------------------

(අ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම අනුව 2013 වර්ෂය තුලදී පාසල් සිසුන් සහ ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් 800 ක් පැවැත්වීමට ඉලක්ක කර තිබුණද රැස්වීම් 654 ක් පමණක් පවත්වා තිබුණි.

(ආ) ක්‍රියාකාරී සැලැස්ම අනුව ප්‍රාදේශීය ඉඩම් පරිහරණ සැලසුම් වාර්තා 166 ක් නිකුත් කිරීමට සැලසුම් කර තිබුණද කාර්යය සාධන වාර්තාවේ එහි ප්‍රගතිය දක්වා නොතිබුණි.

**5.9** **මානව සම්පත් කළමනාකරණය**

--------------------------------

**(අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

-----------------------------------------------------

2013 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍යසේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 11 | 06 | 05 |
| (ii) | තෘතියික මට්ටම | 27 | 17 | 10 |
| (iii) | ද්විතියික මට්ටම | 585 | 477 | 108 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 69 | 66 | 03 |
| | **එකතුව** | **692** | **566** | **126** |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 126 ක් පිරවීමට ආයතනය කටයුතු කර නොතිබුණි.